# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/34 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත**

182 (2) (අ) වගන්තිය යටතේ නියාමනය

2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 182(2) (අ) වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සකස් කරන ලද රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි 2023 අංක 1 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රෙගුලාසි ලෙස දැක්විය හැක.
2. මෙම රෙගුලාසිවල I උපලේඛනයේ දක්වා ඇති ගාස්තු සහ ගෙවීම් වෙළඳපල අතරමැදියන් සඳහා අදාළ වේ.
3. මෙම රෙගුලාසිවල II උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු සහ ගෙවීම් වෙළඳපල ආයතන සඳහා අදාළ වේ.
4. මෙම රෙගුලාසි 2024 පෙබරවාරි 01 දින සිට බලාත්මක වේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

| සංස්ථාපිත මූල්‍ය උපදේශක | | |
|---|---|---|
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 1. | සංස්ථාපිත මූල්‍ය උපදේශක ආයතනයක් ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94 (1) වගන්තිය යටතේ සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමගම රු. 150,000/-ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 2. | අයදුම්කරු සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අතිවිශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 250,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 3. | සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 4. | සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 300,000/- භාර දිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 5. | බලපත්‍රලාභී සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 11 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 6. | සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තුව ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනය | | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 7. | ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ව්‍යාපාර කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබාදීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමගම රු.150,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍ර ගාස්තුව | 8. | අයදුම්කරුණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා 'ප්‍රතිපත්තිමය' අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයකට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අතිවිශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත්කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 500,000/- ක මුදලක් භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 9. | ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 10. | ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 500,000/- භාරදිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 11. | බලපත්‍රලාභී ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් විසින් බලපත්‍රය අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 11 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 12. | ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තු ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| | | ආයෝජන කළමනාකරු |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 13. | ආයෝජන කළමනාකරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයෝජන කළමනාකරණ ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ ආයෝජන කළමනාකරුවෙකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු.50,000/-ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| ආයෝජන කළමනාකරු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 14. | අයදුම්කරු ආයෝජන කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව,කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් ආයෝජන කළමනාකරුවකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අතිවිශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 250,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 15. | ආයෝජන කළමනාකරුවෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| බලපත්‍රය අලුත් කිරීම | 16. | ආයෝජන කළමනාකරුවෙකු ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 300,000/- භාරදිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 17. | බලපත්‍රලාභී ආයෝජන කළමනාකරුවෙකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 12 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 18. | ආයෝජන කළමනාකරුවෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තු ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| | | කළමනාකරණ සමාගම |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 19. | කළමනාකරණ සමාගමක් කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ කළමනාකරණ සමාගමක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබාදීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමගම රු. 50,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| කළමනාකරණ සමාගමක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍ර ගාස්තුව<br><br><br>සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක් අනුමත කිරීම සඳහා ගාස්තු | 20. | (අ) අයදුම්කරු කළමනාකරණ සමාගමක් ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා " ප්‍රතිපත්තිමය " අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් කළමනාකරණ සමාගමකට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අතිවිශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත්කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6 (ආ ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 250,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය.<br><br>(ආ) බලපත්‍රලාභී කළමනාකරණ සමාගමක් සෑම සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක් වෙනුවෙන්ම අනුමැතීන් ලබාගන්නා අවස්ථාවකදී 2022 මැයි 07 වැනි දින *අතිවිශෙෂ ගැසට්* පත්‍ර අංක 2278/27 හි ප්‍රකාශයට පත් කරන ලද 2022 සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහයේ 12 රීති ප්‍රකාරව එක් එක් සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේ ගාස්තු ලෙස රු. 400,000/-ක මුදලක් ගෙවිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 21. | කළමනාකරණ සමාගමක් ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 22. | කළමනාකරණ සමාගමක් ලෙස ක්‍රියා කිරීමට ලබාදී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 300,000/- ක් භාර දිය යුතුය. |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 23. | බලපත්‍රලාභී කළමනාකරණ සමාගමක් විසින් බලපත්‍රය අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 16 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 24. | කළමනාකරණ සමාගමක් ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තුව ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| | | ආන්තික සැපයුම්කරු |
| 'ප්‍රතිපත්තිමය ' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 25. | ආන්තික සැපයුම්කරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම් ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ ආන්තික සැපයුම්කරුවකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමගම රු. 150,000/-ක සැකසුම් ගාස්තුවක් හාරදිය යුතුය. |
| ආන්තික සැපයුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 26. | අයදුම්කරු ආන්තික සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් ආන්තික සැපයුම්කරුවකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අතිවිශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත්කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමග රු 1,500,000/- බලපත්‍ර ගාස්තුවක් ද හාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 27. | ආන්තික සැපයුම්කරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා බපලත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 28. | ආන්තික සැපයුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 1,500,000/- භාර දිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 29. | බලපත්‍රලාභි ආන්තික සැපයුම්කරුවකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 12 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | |
|---|---|
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 30. ආන්තික සැපයුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන බල පත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තුව ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| කොටස් තැරැව්කරු | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 31. කොටස් තැරැව්කරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ කොටස් තැරැව්කරුවකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් "ප්‍රතිපත්තිමය" අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු. 150,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| කොටස් තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 32. අයදුම්කරු කොටස් තැරැව්කරුවකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් සංස්ථාපිත මූල්‍ය උපදේශකයෙකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශෙෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6 (ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමග රු.500,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 33. කොටස් තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 34. කොටස් තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීමට ලබාදී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 500,000/-භාරදිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 35. බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 11 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 36. කොටස් තැරැව්කරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තුව ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| කොටස් වෙළෙන්දා | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 37. කොටස් වෙළෙන්දකු ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94 (1) වගන්තිය යටතේ කොටස් වෙළෙන්දකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු 150,000/-ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | |
|---|---|
| කොටස් වෙළෙන්දෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 38. අයදුම්කරු කොටස් වෙළෙන්දෙකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් කොටස් වෙළෙන්දකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශේෂ ගැසට්* අංක 2271/09 ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6 (ආ ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 250,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 39. කොටස් වෙළෙන්දෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 40. කොටස් වෙළෙන්දෙකු ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 250,000/- භාරදිය යුතුය. |
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 41. බලපත්‍රලාභී කොටස් වෙළෙන්දකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 11 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 42. කොටස් වෙළෙන්දෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තුව ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් එය අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |
| ප්‍රතිරක්ෂක | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 43. ප්‍රතිරක්ෂක ආයතනයක් ලෙස ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 94(1) වගන්තිය යටතේ ප්‍රතිරක්ෂක ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු. 150,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| ප්‍රතිරක්ෂයෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ගාස්තුව | 44. අයදුම්කරු ප්‍රතිරක්ෂකයකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් ප්‍රතිරක්ෂකයකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශේෂ ගැසට්* අංක 2271/09 හි ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 250,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 45. ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| බලපත්‍රය අලුත් කිරීම | 46. ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීමට ලබා දී ඇති බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් සමඟ අලුත් කිරීමේ ගාස්තුව රු. 250,000/- භාරදිය යුතුය. |

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

| | | |
|---|---|---|
| ප්‍රමාද වූ අලුත් කිරීම සඳහා දඩ | 47. | බලපත්‍රලාභී ප්‍රතිරක්ෂකයකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා වන අයදුම්පතක් නියමිත දින හෝ ඊට පෙර එනම් බලපත්‍රය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා මූල්‍ය උපදේශන රීති 12 අනුකූලව පහත සඳහන් පරිදි දඩ මුදල් ගෙවිය යුතුය.<br><br>● නියමිත දිනට පසු දින 1 සිට 30 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 1/3<br>● නියමිත දිනට පසු දින 31 සිට 60 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවෙන් 2/3<br>● නියමිත දිනට පසු දින 61 සිට 90 දක්වා කාලය තුළ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා - අලුත් කිරීමේ ගාස්තුවට සමාන මුදලක් |
| අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී | 48. | ප්‍රතිරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන බලපත්‍රයක් අලුත් කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම අයදුම්කරු විසින් ගෙවන ලද අලුත් කිරීමේ ගාස්තු ප්‍රමාද වී අලුත් කිරීම සඳහා වන දඩ මුදලක් ඇත්නම් නම් අයකර ගැනීමට යටත්ව ආපසු ගෙවනු ලැබේ. |

| උපලේඛනය II | | |
|---|---|---|
| කොටස් හුවමාරුව | | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 1. | කොටස් හුවමාරුවක් කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 26 (1) වගන්තිය යටතේ කොටස් හුවමාරුකරුවකු ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය ' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමගම රු. 250,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| කොටස් හුවමාරුකරුවකු ලෙස ක්‍රියාකිරීමට වීමට බලපත්‍ර ගාස්තුව | 2. | අයදුම්කරු කොටස් හුවමාරුකරුවකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් කොටස් හුවමාරුකරුවකුට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශෙෂ ගැසට්* අංක 2271/10 හි ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 6(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමග රු. 15,000,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 3. | කොටස් හුවමාරුකරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම | 4. | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 76 වගන්තිය අනුව බලපත්‍රලාභී කොටස් හුවමාරුකරුවන් විසින් එක් ලිත් වර්ෂයකට අදාළව රු 1,000,000/- බලපත්‍ර ගාස්තුවක් ජනවාරි මස 31 හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම සඳහා දඩ | 5. | සෑම ලිත් වර්ෂයකම ජනවාරි 31 වැනි දින වන විට වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීමට අපොහොසත් වන ඕනෑම බලපත්‍රලාභී කොටස් හුවමාරුවක රු. 500,000/- දඩ මුදලක් ගෙවිය යුතුය. |

| උපලේඛනය II *(සම්බන්ධිතයි)* | | |
|---|---|---|
| නිෂ්කාශනාගාරය | | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 6. | නිෂ්කාශනාගාරයක් කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 36 (1) වගන්තිය යටතේ නිෂ්කාශනාගාරයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු. 250,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| නිෂ්කාශනාගාරයක් ලෙස ක්‍රියාකිරීමට බලපත්‍ර ගාස්තුව | 7. | නිෂ්කාශනාගාරයක් ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා 'ප්‍රතිපත්තිමය ' අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් නිෂ්කාශනාගාරයකට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශෙෂ ගැසට්* අංක 2271/10 හි ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 5(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 2,500,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 8. | නිෂ්කාශනාගාරයක් ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම | 9. | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 76 වගන්තිය අනුව බලපත්‍රලාභී නිෂ්කාශනාගාරයක් විසින් එක් ලිත් වර්ෂයකට අදාළව රු. 100,000/- බලපත්‍ර ගාස්තුවක් ජනවාරි මස 31 හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම සඳහා දඩ | 10. | සෑම ලිත් වර්ෂයකම ජනවාරි 31 වැනි දිනට වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීමට අපොහොසත් වන බලපත්‍රලාභී නිෂ්කාශනාගාරයක් විසින් රු. 500,000/- දඩ මුදලක් ගෙවිය යුතුය. |
| මධ්‍යම තැන්පතුගාරය | | |
| 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන අයදුම්පතක් වෙනුවෙන් සැකසුම් ගාස්තු | 11. | මධ්‍යම තැන්පතුගාරයක් කරගෙන යාමට අදහස් කරන ඕනෑම ආයතනයක් විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 55(1) වගන්තිය යටතේ මධ්‍යම තැන්පතුගාරයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දීම වෙනුවෙන් 'ප්‍රතිපත්තිමය' අනුමැතිය සඳහා වන සෑම අයදුම්පතක් සමඟම රු. 250,000/- ක සැකසුම් ගාස්තුවක් භාරදිය යුතුය. |
| මධ්‍යම තැන්පතුගාරයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍ර ගාස්තුව | 12. | අයදුම්කරු මධ්‍යම තැන්පතුගාරයක් ලෙස කටයුතු කිරීමට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා "ප්‍රතිපත්තිමය" අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් නියම කරන ලද කොන්දේසි සපුරාලන විට, එවැනි අයදුම්කරුවකු විසින් මධ්‍යම තැන්පතුගාරයකට අදාළ වන 2022 මාර්තු 15 වැනි දින *අති විශෙෂ ගැසට්* අංක 2271/10 හි ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීති යටතේ 5(ආ) හි සඳහන් කර ඇති ලිපි ලේඛන සමඟ රු. 2,500,000/- බලපත්‍ර ගාස්තුවක් ද භාරදිය යුතුය. |
| අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී | 13. | මධ්‍යම තැන්පතුගාරයක් ලෙස ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම වෙනුවෙන් වන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, අදාළ අයදුම්කරු විසින් ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ගෙවන ලද සැකසුම් ගාස්තු කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම | 14. | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 76 වගන්තිය අනුව බලපත්‍රලාභී මධ්‍යම තැන්පතුගාරයක් විසින් එක් ලිත් වර්ෂයකට අදාළව රු. 100,000/- බලපත්‍ර ගාස්තුවක් ජනවාරි මස 31 හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. |
| වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම සඳහා දඩ | 15. | සෑම ලිත් වර්ෂයකම ජනවාරි 31 වැනි දිනට වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීමට අපොහොසත් වන බලපත්‍රලාභී මධ්‍යම තැන් න්පතුගාරයක් විසින් රු. 500,000/-ක දඩයක් ගෙවිය යුතුය. |

EOG 01 - 0115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.